# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1597/ 2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023 திகதி
දිනය / Date — 19/12/2023 පැය 1900

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද මුදලින් මිලදී ගත් බවට සැක කරන වාහන පොලිස් භාරයට ගැනීම - නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය.**

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදා හරින්නන්ගේ ජාලයන් මර්ධනය කර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි 2023.12.17 වන දින සිට විශේෂ මෙහෙයුම් ආරම්භ කෙරිණි.

එයට සමගාමීව, මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද මුදලින් මිලදී ගන්නා ලද බවට සැකකරන විවිධ පුද්ගලයින්ට අයත් රථවාහන 09 ක් නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය භාරයට ගෙන ඇත. ඒ අතර වෑන් රථ 02 ක්, කාර් රථ 03 ක්, ජීප් රථයක්, ටිපර් රථ 02 ක් සහ ස්කූටර් වර්ගයේ යතුරු පැදියක් වේ.

2023.12.19 වන අද දින උදෑසන කිරුළපන ඇවනියු, කොළඹ 05 ලිපිනයේ පිහිටි එම කොට්ඨාසයේදී වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් අදාල රථවාහන පරීක්ෂාවට ලක් කල අතර එම අවස්ථාවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිවරයා ඇතුළු නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයාද, උසස් නිලධාරීන්ද සහභාගී විය.

මෙම අවස්ථාවට අදාල වීඩියෝ පටයක් හා ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.


VIGOR
ND - 3714
CAS 2048


WP KW - 4798
NC PG - 7882
sparco
PIRELLI
brembo



